# 6 ශ්‍රේණිය

## ගණිතය

### 4 පාඩම

# කාලය




වසන්ත බණ්ඩාර

( විද්‍යා පීඨ ගණිත පුහුණු )


071 4469743


LIVEWORKSHEETS

Win Maths Wasantha Bandara ගණිතය


LIVEWORKSHEETS

# පැය 12 ඔරලෝසුවෙන් වේලාව නිවැරදිව කියවීම



- ඔරලෝසුවක කටු තුනක් පවතී.

.......................................................................


.......................................................................

.......................................................................

- ඔරලෝසුවේ කටු තුනම දක්ෂිණාවර්තව කරකැවේ
- තත්පර කටුව සම්පූර්ණයෙන් වටයක් ගමන් කිරීමට ගතවන කාලය මිනිත්තු එකකි.

- මිනිත්තු කටුව සම්පූර්ණයෙන් වටයක් ගමන් කිරීමට ගතවන කාලය පැය එකකි.

- පැය කටුව සම්පූර්ණයෙන් වට දෙකක් යාමට එක් දිනයක් ගතවේ.



.......................................................................




LIVEWORKSHEETS

**අභ්‍යාසය 01**


**01.** පහත එක් එක් ඔරලෝසුවේ දැක්වෙන වේලාවන් පැය, මිනිත්තු හා තත්පර ඇසුරෙන් ලියා දක්වන්න.

( i )




..........................................................................................

( ii )




..........................................................................................

( iii )




..........................................................................................

( iv )



..........................................................................................

( v )



..........................................................................................



LIVEWORKSHEETS

## පෙරවරු හා පස්වරු හඳුනා ගැනීම.

- පැය 12 ඔරලෝසුවෙන් එක් දිනයක් තුළ එකම වේලාව අවස්ථා දෙකකදී පෙන්නුම් කරයි.



වේලාව : උදෑසන 07:00



වේලාව : රාත්‍රී 07:00

- මේ නිසා එක් දිනයක් වරු දෙකක් ලෙස බෙදා ඇත.
  එනම්,
  පෙරවරු : මධ්‍යම රාත්‍රී 12:00 සිට මධ්‍යාන 12:00 දක්වා කාලය.
  පස්වරු : මධ්‍යාහ්න 12:00 සිට මධ්‍යම රාත්‍රී 12:00 දක්වා කාලය

- දිවා කාලයේදී කටු තුනම 12 ට යොමුව ඇති විට වේලාව මධ්‍යාහ්න 12:00 වේ.
- රාත්‍රී කාලයේදී කටු තුනම 12 ට යොමුව ඇති වේලාව මධ්‍යම රාත්‍රී 12:00 වේ.
- මධ්‍යම රාත්‍රී 12:00 සිට ඊළඟ මධ්‍යම රාත්‍රී 12:00 දක්වා කාලය දිනයක් වේ.

## පැය 24 ඔරලෝසුවෙන් වේලාව කියවීම



පැය 24 ඔරලෝසුවෙන් වේලාව කියවීමේදී පෙරවරු හෝ පස්වරු භාවිත නොවේ. ඊට හේතුව පැය 24 ඔරලෝසුවෙන් මධ්‍යාන දොළහට පසු වේලාවන් 13:00 සිට 24:00 දක්වා අංක වලින් හඳුන්වයි.

එනම්,

පෙ.ව.- ..........................................................................................

ප.ව.- ..........................................................................................

උදා : ..........................................................................................

..........................................................................................

..........................................................................................



LIVEWORKSHEETS

## සම්මත ආකාරයෙන් වේලාව දැක්වීම.

- රට රටවල් අතර ගනුදෙනු කිරීම වැනි විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීමේදී වේලාව යනු ඉතා වැදගත් මිනුමකි.
- මේ නිසා වේලාව කියවීමට **අන්තර්ජාතික සම්මත ක්‍රමයක්** හඳුන්වා දී ඇත.

**පැය : මිනිත්තු : තත්පර**

**hh : mm : ss**

- පැය, මිනිත්තු හා තත්පර ගණන ඉලක්කම් දෙකකින් ලියා දක්වයි
- තත්පර ගණන නොදක්වන අවස්ථාවලදී පැය හා මිනිත්තු පමණක් ලියා දක්වයි.
- පැය, මිනිත්තු හා තත්පර වෙන්කර දක්වයි.

❖ **පැය 12 ඔරලෝසුවෙන් දැක්වෙන වේලාවන් පහත පරිදි සම්මත ක්‍රමයට ලියා දැක්විය හැක.**

| පැය 12 ක්‍රමයට අනුව වේලාව | සම්මත ක්‍රමයට අනුව වේලාව |
|---|---|
| පෙ.ව. 1.00 | |
| පෙ.ව. 2.00 | |
| පෙ.ව. 3.00 | |
| පෙ.ව. 4.00 | |
| පෙ.ව. 5.00 | |
| පෙ.ව. 6.00 | |
| පෙ.ව. 7.00 | |
| පෙ.ව. 8.00 | |
| පෙ.ව. 9.00 | |
| පෙ.ව. 10.00 | |
| පෙ.ව. 11.00 | |
| මධ්‍යාහ්න 12.00 | |
| ප.ව. 1.00 | |
| ප.ව. 2.00 | |
| ප.ව. 3.00 | |
| ප.ව. 4.00 | |
| ප.ව. 5.00 | |
| ප.ව. 6.00 | |
| ප.ව. 7.00 | |
| ප.ව. 8.00 | |
| ප.ව. 9.00 | |
| ප.ව. 10.00 | |
| ප.ව. 11.00 | |
| මධ්‍යම රාත්‍රී 12.00 | |

Win Maths Vasantha Bandara



LIVEWORKSHEETS

**අභ්‍යාසය 02**

**01.** ශ්‍රී ලංකාවේ උතුරු දුම්රිය මාර්ගය වන කොළඹ සිට කන්කසන්තුරය දක්වා වන දුම්රිය මාර්ගයේ කොළඹින් පෙරවරු 8:00 පිටත් වූ දුම්රියක් එක් එක් නැවතුම් පොළවල් පසුකර යන වේලාවන් පහත දැක්වේ.එම වේලාවල් සම්මත ආකාරයෙන් දක්වන්න.

| නැවතුම් පොළ | පසුකර යන වේලාවන් | වේලාව සම්මත ආකාරයෙන් |
|---|---|---|
| කොළඹ කොටුව | පෙ.ව. 8:00 | |
| පොල්ගහවෙල | පෙ.ව. 9:20 | |
| කුරුණෑගල | පෙ.ව. 9:45 | |
| මහව හන්දිය | පෙ.ව. 10:25 | |
| අනුරාධපුරය | ප.ව. 12:20 | |
| වවුනියාව | ප.ව. 1:00 | |
| කිලිනොච්චිය | ප.ව. 2:10 | |
| යාපනය | ප.ව. 3:15 | |
| කන්කසන්තුරේ | ප.ව. 3:30 | |

**02.** පහත එක් එක් සිදුවීම්හි වේලාවන් සම්මත ආකාරයෙන් සඳහන් කරමින් නැවත ලියන්න.

**i.** කසුන්ගේ පාසල ආරම්භ වන්නේ පෙරවරු 7:30 ට ය.

..........................................................................................................

**ii.** පවුලේ සැම එක්ව දහවල් ආහාරය ගන්නේ පස්වරු 1:45 ට ය.

..........................................................................................................

**iii.** රුවන්ගේ ප්‍රියතම කාටූන් වැඩසටහන රූපවාහිනියේ විකාශය වන්නේ පස්වරු 5:00 ට ය.

..........................................................................................................

**iv.** යාපනය බලා ධාවනයවන රාත්‍රී තැපැල්දුම්රිය කොළඹින් පිටත් වන්නේ පස්වරු 8:15 ට ය.

..........................................................................................................

**v.** නව වසර උදාවන්නේ මධ්‍යම රාත්‍රී 12:00 ට ය.

..........................................................................................................



LIVEWORKSHEETS

**03.** පහත වගන්ති අතරින් සත්‍ය විය හැකි වගන්ති ඉදිරියෙන් " √ " ලකුණද අසත්‍ය විය හැකි වගන්ති ඉදිරියෙන් " **X** " ලකුණද යොදන්න.

**i.** පියල් පාසල නිමවී ගෙදර පැමිණෙන විට සාමාන්‍යයෙන් වේලාව පැය 02:30 පමණ වේ. ☐

**ii.** කසුන් උදෑසන අවදි වීමට ප්‍රමාද වීම නිසා එදින පාසලට යනවිට වේලව පැය 08:15 පමණ විය. ☐

**iii.** සෑම දිනකම සාමාන්‍යයෙන් පැය 06:00 වේලාවට පෙර අවදිවීම හොඳ පුරුද්දකි. ☐

**iv.** නිමල් දහවල් කාලයේදි ක්‍රිකට් ක්‍රීඩා කිරීමට පිට්ටනියට ගිය අතර ඔහු නැවත පැමිණෙන විට වේලාව පැය 05:30 පමණ විය. ☐

**v.** පැය 08:30 ට රත්නපුර නගරයෙන් පිටත් වූ බස් රථයක් පැය 12:00 පමණ වනවිට මහරගම නගරයට ලගාවිය. ☐

## සම්මත ආකාරයෙන් දිනය දැක්වීම

❖ සම්මත ආකාරයෙන් දිනය ලිවීමේ දී,

- පළමු ව වර්ෂය, දෙවනු ව මාසය, තෙවනු ව දිනය දැක්විය යුතු වේ.
- වර්ෂය දැක්වීමට ඉලක්කම් හතරක් ද මාසය දැක්වීමට ඉලක්කම් දෙකක් ද දිනය දැක්වීමට ඉලක්කම් දෙකක් බැගින් ලිවිය යුතු ය.
- වර්ෂය, මාසය හා දිනය වෙන් කර දක්වයි.

උදා : 2002 වර්ෂයේ ඔක්තොම්බර් මස 25 වන දින - ........................................................

**අභ්‍යාසය 03**

**01.** පහත දැක්වෙන දිනයන් අන්තර්ජාතික සම්මත ආකාරයෙන් හිස්තැන් මත ලියන්න.

**i.** 2024 වර්ෂයේ මාර්තු මාසයේ 08 වැනිදා = ....................................................

**ii.** 2025 වර්ෂයේ අගෝස්තු 25 වැනිදා = ....................................................

**iii.** 2026 වර්ෂයේ මැයි මාසයේ 4 වැනිදා = ....................................................

**iv.** 2023 වර්ෂයේ නොවැම්බර් 12 වැනිදා =....................................................

**v.** 2026 ජනවාරි 1 වැනිදා = ....................................................


LIVEWORKSHEETS

**02.** පහත වගන්ති කියවා, එහි සඳහන් දිනය අන්තර්ජාතික සම්මත ආකාරයෙන් ලියන්න.

**i.** ශ්‍රී ලංකාවට නිදහස ලැබුණේ 1948 වර්ෂයේ පෙබරවාරි මාසයේ 04 වැනිදාය.

......................................................

**ii.** කමල්ගේ උපන්දින සාදය 2026 වසරේ අප්‍රේල් මාසයේ 9 වැනිදාට යෙදී ඇත.

......................................................

**iii.** පාසලේ වාර්ෂික ක්‍රීඩා උත්සවය පැවැත්වෙන්නේ 2026 ජූලි මාසයේ 22 වැනිදාය.

......................................................

**iv.** ලෝක ළමා දිනය සමරන්නේ සෑම වසරකම ඔක්තෝබර් මාසයේ 01 වැනිදාය. 2026 වසරේ ලෝක ළමා දිනය සම්මත ආකාරයෙන් ලියන්න.

......................................................

**v.** ඔබ මෙම අභ්‍යාසය සිදු කරන අද දිනය සම්මත ආකාරයෙන් ලියන්න.

......................................................

**03.** පහත දැක්වෙන සිදුවීම් කියවා, ඒවාට අදාළ දිනය සහ වේලාව අන්තර්ජාතික සම්මත ආකාරයෙන් හිස්තැන් මත ලියන්න.

**i.** පාසලේ විනෝද චාරිකාව සඳහා දුම්රිය පිටත් වන්නේ 2026 අගෝස්තු මාසයේ 12 වැනිදා පෙරවරු 6:15 ට ය.

සම්මත දිනය:............................ පැය 24 වේලාව:..........................

**ii.** කසුන්ගේ පියා විදේශගත වන ගුවන් යානය කටුනායකින් පිටත් වන්නේ 2026 නොවැම්බර් මාසයේ 5 වැනිදා පස්වරු 8:30 ට ය.

සම්මත දිනය:............................ පැය 24 වේලාව:..........................

**iii.** මෙවර සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද උදාවන්නේ 2026 අප්‍රේල් මාසයේ 14 වැනිදා දහවල් 1:20 ට ය.

සම්මත දිනය: ....................... පැය 24 වේලාව: .......................


LIVEWORKSHEETS

**iv.** ශ්‍රී ලංකා කණ්ඩායම සහ ඉන්දීය කණ්ඩායම අතර ක්‍රිකට් තරගය ආරම්භ වන්නේ 2026 මාර්තු මාසයේ 8 වැනිදා පස්වරු 2:45 ට ය.

සම්මත දිනය: ........................ පැය 24 වේලාව: ........................


**v.** හය ශ්‍රේණියේ ගණිතය වාර විභාගය ආරම්භ වන්නේ 2026 ජූලි මාසයේ 20 වැනිදා පෙරවරු 8:00 ට ය.

සම්මත දිනය: ........................ පැය 24 වේලාව: ........................

## කාලය මනින ඒකක අතර සම්බන්ධතාව

| |
|---|
| |
| |
| |
| |

**❖ මිනිත්තු හා තත්පර අතර සම්බඳතාව**



Randima Gunawardhana

**අභ්‍යාසය 04**

**01.**පහත දී ඇති මිනිත්තු, තත්පර බවට පරිවර්තනය කර හිස්තැන් පුරවන්න.

**i.** මිනිත්තු 3 = තත්පර ........................

**ii.** මිනිත්තු 5 = තත්පර ........................

**iii.** මිනිත්තු 10 = තත්පර ........................

**iv.** මිනිත්තු 1 යි තත්පර 15 = තත්පර ........................

**v.** මිනිත්තු 2 යි තත්පර 30 = තත්පර ........................

**02.**පහත දී ඇති තත්පර, මිනිත්තු බවට පරිවර්තනය කර හිස්තැන් පුරවන්න.

**i.** තත්පර 120 = මිනිත්තු ........................


**ii.** තත්පර 240 = මිනිත්තු ........................

**iii.** තත්පර 360 = මිනිත්තු ........................

**iv.** තත්පර 90 = මිනිත්තු ........................ තත්පර ........................

**v.** තත්පර 150 = මිනිත්තු ........................ තත්පර ........................

❖ **පැය හා මිනිත්තු අතර සම්බන්ධතාව**



Randima Gunawardhana



LIVEWORKSHEETS

**අභ්‍යාසය 04**

**01.**පහත දී ඇති පැය, මිනිත්තු බවට පරිවර්තනය කර හිස්තැන් පුරවන්න.

**i.** පැය 3 = මිනිත්තු ........................

**ii.** පැය 4 = මිනිත්තු ........................

**iii.** පැය 10 = මිනිත්තු ........................

**iv.** පැය 1 යි මිනිත්තු 20 = මිනිත්තු ........................

**v.** පැය 2 යි මිනිත්තු 45 = මිනිත්තු ........................

**02.**පහත දී ඇති මිනිත්තු, පැය හා මිනිත්තු බවට පරිවර්තනය කර හිස්තැන් පුරවන්න.

**i.** මිනිත්තු 120 = පැය ........................

**ii.** මිනිත්තු 300 = පැය ........................


**iii.** මිනිත්තු 420 = පැය ........................

**iv.** මිනිත්තු 80 = පැය ........................ මිනිත්තු ........................

**v.** මිනිත්තු 150 = පැය ........................ මිනිත්තු ........................

Win Maths Wasantha Bandara ගණිතය

❖ **දින සහ පැය අතර සම්බන්ධතාව**





LIVEWORKSHEETS

**අභ්‍යාසය 05**

**01.** පහත දී ඇති දින, පැය බවට පරිවර්තනය කර හිස්තැන් පුරවන්න.

i. දින 2 = පැය ......................

ii. දින 3 = පැය ......................

iii. දින 5 = පැය ......................

iv. දින 1 යි පැය 10 = පැය ......................

v. දින 2 යි පැය 5 = පැය ......................

**02.** පහත දී ඇති පැය, දින (හා පැය) බවට පරිවර්තනය කර හිස්තැන් පුරවන්න.

i. පැය 48 = දින ......................

ii. පැය 72 = දින ......................

iii. පැය 120 = දින ......................

iv. පැය 30 = දින ...................... පැය ......................

v. පැය 50 = දින ...................... පැය ......................

## ගත වූ කාලය

- යම් කාර්යයක් හෝ යම් සිදුවීමක් හෝ සඳහා ගත වන කාලය, එම කාර්යය හෝ සිදුවීම හෝ අවසාන වූ වේලාව හා ආරම්භ වූ වේලාව අතර වෙනස වේ.
- එලෙස ගත හැක්කේ පැය 12 ක්‍රමයට වේලාව දක්වන කල්හි එකම වරුවක් තුළ සිදුවන සිදුවීම් සඳහා ද පැය 24 ක්‍රමයට වේලාව දක්වන කල්හි එක් දිනයක් තුළ සිදු වූ සිදුවීම් සඳහා ද පමණි.

**පාසල් දිනයක ඔබ පාසල තුල ගතකරන කාලය සොයමු.**

- පාසල ආරම්භ වන වේලාව :...............................................
- පාසල අවසාන වන වේලාව :...............................................
- පාසල තුල ගතකල කාලය :...............................................



LIVEWORKSHEETS

## අභ්‍යාසය 06

01. පහත දී ඇති ආරම්භක වේලාව සහ අවසන් වූ වේලාව භාවිතා කර, ගතවූ කාලය (පැය සහ මිනිත්තු වලින්) සොයන්න.

| ආරම්භය | අවසන් වීම | ගතවූ කාලය |
|---|---|---|
| 08:00 | 10:30 | |
| 14:15 | 16:45 | |
| 09:40 | 11:20 | |
| 07:50 | 12:10 | |

02. පහත දැක්වෙන වගන්ති ප්‍රශ්න හොඳින් කියවා, අදාළ සිදුවීමට ගතවූ කාලය සොයන්න.

**i.** හය ශ්‍රේණියේ විද්‍යාව වාර විභාගය උදෑසන 08:30 ට ආරම්භ වී උදෑසන 10:30 ට අවසන් විය. විභාගය සඳහා ලබා දී තිබූ සම්පූර්ණ කාලය කොපමණද?

..........................................................................

**ii.** කොළඹින් පෙරවරු 06:15 ට පිටත් වූ බස් රථයක් මහනුවරට ළඟා වූයේ පෙරවරු 09:45 ට ය. ඒ සඳහා බස් රථය කොපමණ කාලයක් ගමන් කර ඇත්ද?

..........................................................................

**iii.** නිමල් සවස 16:30 ට (ප.ව. 4:30) ක්‍රිකට් ක්‍රීඩා කිරීම ආරම්භ කළ අතර, ඔහු සෙල්ලම් කර අවසන් කළේ 18:15 ට (ප.ව. 6:15) ය. ඔහු ක්‍රීඩා කළ කාලය කොපමණද?

..........................................................................

**iv.** රූපවාහිනියේ විකාශය වූ චිත්‍රපටයක් රාත්‍රී 19:45 ට ආරම්භ වී රාත්‍රී 22:10 ට අවසන් විය. චිත්‍රපටය ධාවනය වූ කාලය පැය සහ මිනිත්තු වලින් කොපමණද?

..........................................................................

**v.** පෙරවරු 05:20 ට මාතරින් පිටත් වූ දුම්රියක් පෙරවරු 06:10 ට ගාල්ලට ළඟා විය. දුම්රිය ගාල්ලට පැමිණීමට ගත කළ කාලය මිනිත්තු වලින් කොපමණද?

..........................................................................



LIVEWORKSHEETS

## කාලය එකතු කිරීම හා අඩු කිරීම

**( i )**

| පැය | මිනිත්තු |
| --- | --- |
| 5 | 32 |
| + 4 | 24 |

**( ii )**

| මිනිත්තු | තත්පර |
| --- | --- |
| 4 | 53 |
| + 4 | 24 |

**( iii )**

| පැය | මිනිත්තු |
| --- | --- |
| 8 | 24 |
| - 5 | 35 |

**( iv )**

| මිනිත්තු | තත්පර |
| --- | --- |
| 12 | 05 |
| - 05 | 32 |

**අභ්‍යාසය 07**

**01.**එකතු කරන්න

i. පැය 2 මිනිත්තු 20 + පැය 1 මිනිත්තු 30
ii. පැය 3 මිනිත්තු 45 + පැය 2 මිනිත්තු 25
iii. පැය 5 මිනිත්තු 50 + පැය 1 මිනිත්තු 40
iv. පැය 2 මිනිත්තු 30 + පැය 1 මිනිත්තු 15
v. පැය 3 මිනිත්තු 50 + පැය 2 මිනිත්තු 40

Win Maths Wasantha Bandara ගණිතය

**02.**අඩු කරන්න

i. පැය 4 මිනිත්තු 45 - පැය 2 මිනිත්තු 15
ii. පැය 5 මිනිත්තු 10 - පැය 2 මිනිත්තු 30
iii. පැය 6 මිනිත්තු 05 - පැය 3 මිනිත්තු 45
iv. පැය 5 මිනිත්තු 45 - පැය 2 මිනිත්තු 20
v. 19. පැය 4 මිනිත්තු 15 - පැය 1 මිනිත්තු 45
vi. 20. පැය 6 මිනිත්තු 10 - පැය 3 මිනිත්තු 50



LIVEWORKSHEETS